**ශීර්ෂය 119 - විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**
**-----------------------------------------------**

**විගණන විෂය පථය**
----------------------
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 08 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

-------------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-----------------------------------------

අමාත්‍යාංශය විසින් ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව යාවත්කාලීන කර පවත්වා නොතිබුණු අතර වාහන පිළිබඳ සියලු විස්තර එහි ඇතුළත් කර නොතිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 28,550,149,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 21,381,068,532 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 7,169,080,468 ක් හෙවත් සියයට 25 ක් ඉතිරි වී තිබුණු අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.** | **රු.** | **රු.** | |
| පුනරාවර්තන | 1,087,399,000 | 710,466,613 | 376,932,387 | 35 |
| මූලධන | 27,462,750,000 | 20,670,601,919 | 6,792,148,081 | 25 |
| **එකතුව** | **28,550,149,000** | **21,381,068,532** | **7,169,080,468** | **25** |

**(ii) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වැය විෂයයන් 24 ක් සඳහා සළසා තිබුණු රු.1,384,519,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.
- වැය විෂයයන් 23 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.
- සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 12 කට සළසා තිබූ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.8,851,040 ක් වී තිබුණි. මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව එම ප්‍රතිපාදන ඉතිරිය රු.6,395,193 කින් ඉක්මවා රු.15,246,233 ක බැරකම්වලට එළඹ තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාලව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11901 | 5,000,000 | 2,960,963 | 2,400,000 | 2,988,753 | 20,000,000 | 10,527,579 |

**(ඇ) අග්‍රිම ගිණුම්**

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුමේ ශේෂය රු.13,442,220 ක්වූ අතර එම ශේෂයෙන් රු.8,065,332 ක් 2014 අප්‍රේල් 30 දින වන විටත් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නිරවුල් කර නොතිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

2013 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂවල එකතුව රු.879,687 ක් වූ අතර එම ශේෂයෙන් වර්ෂ 2 ක් ඉක්මවූ රු.197,523 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි අමාත්‍යාංශයේ මෙහෙවර, ප්‍රධාන කාර්යයන් හා ඉලක්කගත අරමුණු ඉටු කිරීමට බලාපොරොත්තු වන කාලවකවානු ආදිය ඇතුළත් කර නොතිබුණි.

**1.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**-------------------------------**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක පීඑෆ්/402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිවරයාට පිටපතක් සහිත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2013 වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2014 ඔක්තෝබර් 29 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

**1.5 අනුකූල නොවීම්**

------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**---------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන චක්‍රලේඛයේ | | |
| (i) 2.1 ඡේදය | 473,232 | චක්‍රලේඛයේ දක්වා ඇති තනතුරුවලට පරිබාහිරව වෙනත් තනතුරු සඳහා වන නිලධාරීන් අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩල සේවයේ යෙදවීම. |
| | 13,293,768 | අනුමත කාර්ය මණ්ඩලයට අමතරව අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩල වෙත අතිරික්ත නිලධාරීන් 44 දෙනෙකු අනුයුක්ත කිරීම. |
| (ii) 3:1 ඡේදය | | අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම නිල වාහන |

| | | | |
|---|---|---|---|
| | | | සංඛ්‍යාව 3 ක් වුවද, ඊට අනුකූල නොවන පරිදි අමාත්‍යවරයා සඳහා වාහන 06 ක්ද, නියෝජ්‍ය අමාත්‍යවරයා සඳහා වාහන 05 ක්ද වෙන්කර තිබුණි. |
| **(ආ)** | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2009 මාර්තු 24 දිනැති හා 2010 ජූලි 02 දිනැති අංක NSCC/2/1/6/1/1/1-II වෙළුම දරන ලිපි | 401,176 | අනියම් ලිපිකරුවන් අතිකාල සේවයේ යොදවා ඒ වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීම. |
| **(ඇ)** | **ජාතික අයවැය චක්‍රලේඛ**<br>-------------------------<br>2010 අප්‍රේල් 29 දිනැති අංක 146 දරන ජාතික අයවැය චක්‍රලේඛය | - | අමාත්‍යාංශයක ගරු අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ අමාත්‍යාංශ ලේකම්වරයා එකම ස්ථානයක ස්ථානගත වන පරිදි අමාත්‍යාංශය සකස් කර ගත යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි. |

**1.6 මතභේදයට තුඩු දුන් ගනුදෙනු**

-----------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ මතභේදාත්මක ගනුදෙනු කිහිපයක් පහත දක්වා ඇත.

(අ) විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශ සේවය සඳහා යොදවා තිබුණු අධිකාරියකට අයත් රියදුරෙකුගේ වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.367,942 ක්ද, 2010 මැයි සිට 2012 දෙසැම්බර් දක්වා රු1,457,030 ක්ද, අමාත්‍යාංශයේ නියෝගය පරිදි මණ්ඩලයක් විසින් අධිකාරියට ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් මණ්ඩලයකින් 2006 වර්ෂයේදී ලබා ගෙන තිබුණ රු.6,142,276 ක අත්තිකාරම් මුදලක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

## 1.7 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳව තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 17 | 13 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 111 | 51 | 60 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 46 | 35 | 11 | - |
| (v) | වෙනත් | - | 14 | - | 14 |
| | **එකතුව** | **178** | **114** | **78** | **14** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 78 ක් පිරවීමට අපොහොසත් වී තිබුණු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් නොමැතිව බඳවා ගෙන තිබූ අතිරික්ත සේවක සංඛ්‍යාව 14 ක් විය.

### (ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

අමාත්‍යාංශය විසින් අවිධිමත් ලෙස ලබා ගත් මානව සම්පත් පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විධිමත් අනුමැතියකින් තොරව මණ්ඩලයක නිලධාරීන් 24 දෙනෙකු අමාත්‍යාංශයේ සේවයේ යොදවා තිබුණි. ඒ වෙනුවෙන් මණ්ඩලය විසින් 2013 වර්ෂයේදී රු.20,074,851 ක වැටුප් හා දීමනා සහ රු. 1,488,106 ක දිරි දීමනා ද ගෙවා තිබුණි.